1030


# නේවාසික ව්‍යාපෘති කළමනාකරණ කාර්යාලය - හක්වටුනාඔය
වතිවිඩ තිට්ට මුකාමෛයාළර් කාරියාලයම් – හක්වඩුනාඔ
**Resident Project Management Office – Hakwatunaoya**

**වාරිමාර්ග කළමනාකරණ අංශය**
නීර්ප්පාසන මුකමෛත්තුව පිරිවු
**Irrigation Management Division**
**වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය**
නීර්ප්පාසනම් මර්රුම් නීර් මුකාමෛත්තුව අමෛච්චු
**Ministry of Irrigation & Water Resources Management**

එගොඩගම
මාඑළිය
එකොටකම
මාඑලිය
Egodagama
Maeliya


මගේ අංකය / එනතු ඉල. / Your Ref No. 9/3/12
ඔබේ අංකය / උමතු ඉල
දිනය / තිකති / Date 2018/02/22

22 MAR 2018
M01

01ගොවි සංවිධාන නිලධාරීන්,
නියෝජිත මහත්ම/ මහත්මීන්,
02.රාජ්‍ය අංශයේ හා ආයතන මට්ටමේ
ආයතන ප්‍රධානීන්/ නිළධාරි මහත්ම මහත්මීන්,

**<u>2018 පෙබරවාරි මස ව්‍යාපාර කළමනාකරණ කමිටු රැස්වීම හක්වටුනාඔය ව්‍යාපාරය - 2018.02.22.</u>**

හක්වටුනාඔය මහා වාරි ව්‍යාපාරයේ 2018 පෙබරවාරි මස ව්‍යාපාර කළමනාකරන කමිටු රැස්වීම 2018/02/22 වන දින නේවාසික ව්‍යාපාර කළමනාකරුගේ ප්‍රධානත්වයෙන් හක්වටුනාඔය නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලයීය රැස්වීම් ශාලාවේදී පවත්වන ලදී.

01.සහභාගීත්වය

1.1 විශේෂ ආරාධිතයින්

මෙදින රැස්වීමට විශේෂ ආරාධිතයින් කිසිවෙකු සහභාගි නොවීය.

1.2. නිරීක්ෂකයින්

නීරීක්ෂක මහතුන් කිසිවෙකු සහභාගී නොවීය.

**1.1 සහභාගීත්වය:-**

**රාජ්‍ය නිලධාරී මහත්ම මහත්මීන්**

1. ඩබ්.එම්.ඩී ගාමිණී කුසුම් ශ්‍රියානන්ද- නේවාසික ව්‍යාපෘති කළමනාකරු
2. පී.එම්.ඩී.එස්.රත්නායක.-වාරිමාර්ග ඉන්ජිනේරු
3. එම්.පී.ඩී.එස්.කේ. සෝමරත්න -කෘෂි උපදේශක
4. ජී.ආර් අයි.එස් ගම්ලත්-ඉංජිනේරු සහකාර - වාරිමාර්ග දෙපාර්තමේන්තුව
5. ඒ.එම්.බී.එම්. අබේසිංහ -සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ සෝයා බෝග නායක
6. ටී.එම්.ආ[illegible]ජ්.තෙන[illegible]න්-සංවර්ධන නිළධාරී
7. ජී.එම්.සී.එස්.ගුණතිලක- සංවර්ධන නිළධාරී
8. ඒ.එම්.එච්.ඊ.අමරසිංහ- සංවර්ධන නිළධාරී
9. ආර්.එම්.එස්.නවරත්න බංඩාර -(කෘ.ප.නි.ස)
10. ඩී.ආර්.එච්.බී.බංඩාර-(ක්ෂේත්‍ර සහකාර)
11. බී.එම්.එස්.ජේ ගුණතිලක(ක්ෂේත්‍ර සහකාර)
12. එම්.ඩී.එන්.චන්ද්‍රතිලක - තාක්ෂණ සහකාර - වාරිමාර්ග දෙපාර්තමේන්තුව
13. එස්.ඩී.එන්.ජිකනායක - සංවර්ධන නිළධාරී
14. එන්.ඩබ්.එන්.පී එන්.කුමාරි- සංවර්ධන නිළධාරී
15. අයි.ජී.එස්සිරිවර්ධන-සංවර්ධනනිළධාරී

ගොවි සංවිධාන නියෝජිතයින්

1. ඩී.එම්.නිශාන්ත ප්‍රේමචන්ද්‍ර -ගරුසභාපති (ද.ඉ.යාය 7 ඇනිකට් ඇල ගොවි සංවිධානය )
2. ආර්.එම්.තිලකරත්න බණ්ඩා-ගරු ලේකම් (ද.ඉ.යාය 7 ඇනිකට් ඇල ගොවි සංවිධානය )
3. එච්.එම් මුදියන්සේ-ගරුසභාපති (ද.ඉ.යාය 06 ගොවි සංවිධානය)
4. ඊ.එම්ජයතිලක-ගරුසභාපති(ව.ඉ.ඩී 5කුලංකට්ටය අලුත්වැව ගොවි සංවිධානය)
5. ඩබ්.එම්.විජිතසිරි -උප ලේකම් (ද.ඉ.යාය 1-2 තලාකොළවැව බෙදුම්ඇල ගොවි සංවිධානය)
6. ආර්.එම්.නවරත්න-උප සභාපති(ද.ඉ.යාය 1-2 තලාකොළවැව බෙදුම්ඇල ගොවි සංවිධානය)
7. ඊ.එම්.සිසිර කුමාර-ගරු ලේකම්(ද.ඉ.යාය 1-2 තලාකොළවැව බෙදුම්ඇල ගොවි සංවිධානය)
8. ආර්.ජී.චන්ද්‍රසේකර- (ව.ඉ.ඩී 01 උඩයට පාලගම බෙදුම්ඇල ගොවි සංවිධානය)
9. ජී.එම්.සමන්ති නිරෝෂා-ගරු ලේකම්(ව.ඉ.ඩී 01 උඩයට පාලගම බෙදුම්ඇල ගොවි සංවිධානය)
10. ඩබ්.ආරියරත්න-ගරු ලේකම් (ව.ඉ.යාය 4-5 ඩී 3 ආගාර කටුගම්පල බෙ.ගොවි සංවිධානය)
11. බී.වික්‍රමසිංහ-ගරු ලේකම් (ව.ඉ.ඩී 07 දාගම බෙදුම්ඇල ගොවි සංවිධානය)
12. කේ.ඩී.පියදාස- ගරු භාණ්ඩාගාරික (ව.ඉ.ඩී 07 දාගම බෙදුම්ඇල ගොවි සංවිධානය)
13. පී.එම්.යූ පතිරාජ -ගරු සභාපති (ව.ඉ.ඩී 07 දාගම බෙදුම්ඇල ගොවි සංවිධානය)
14. ඊ.එම් විජේසූරිය ඒකනායක- ගරුසභාපති (ව.ඉ.ඩී 03 සිසිල් පොකුණ බෙදුම්ඇල ගොවි සංවිධානය)
15. එච්.එම්.පී.කුමාරි -ගරු භාණ්ඩාගාරික(ව.ඉ.ඩී 03 සිසිල් පොකුණ බෙදුම්ඇල ගොවි සංවිධානය)
16. ජී.එම්.චන්ද්‍රාවති-( ද.ඉ.යාය 04 බෝගොල්ල ගොවි සංවිධානය
17. ජී.එම්.යූ.කේ කරුණාරත්න -ගරු ලේකම් (ද.ඉ.යාය 3 ඩී 8 සියඹලාවැව බෙදුම්ඇල ගොවි සංවිධානය )
18. ආර්.එම්.දිසානායක -ගරු සභාපති (ද.ඉ.යාය 3 ඩී 8 සියඹලාවැව බෙදුම්ඇල ගොවි සංවිධානය )
19. ආර්.ඩී.ගුණතිලක - ගරුසභාපති (ව.ඉ.ඩී 4 ට්‍රැක් 7 තම්බුව බෙදුම් ඇල ගොවි සංවිධානය)
20. එස්.එම් ජයරත්න-ගරු භාණ්ඩාගාරික(ද.ඉ.යාය 3 ඩී 8 සියඹලාවැව බෙදුම්ඇල ගොවි සංවිධානය )
21. කේ.වී අමරතුංග-ගරු සභාපති (ව.ඉ.ඩී 6 චතුරශ්‍ර බෙදුම්ඇල ගොවි සංවිධානය )
22. ජේ.එම්. කවිසේන හේරත් - ගරු සභාපති(ද.ඉ. යාය05 කෝරුවාගාල ගොවි සංවිධානය)
23. ජේ.එම්.කේ.මුදියන්සේ. ගරු සභාපති (ද.ඉ.යාය 04 බෝගොල්ල ගොවි සංවිධානය)
24. එච්.එම් නවරත්න -ගරු භාණ්ඩාගාරික (ද.ඉ.යාය 04 බෝගොල්ල ගොවි සංවිධානය)
25. ද.ඉ. තලාකොළවැව , බෝගොල්ල ,කෝරුවාගාල ගොවි සංවිධාන නියෝජනය කරන ගොවීන් පිරිසක්)

02.ප්‍රථමයෙන්ම ආගමික වතාවත් ඉටුකිරීමෙන් අනතුරුව නේවාසික ව්‍යාපාර කළමනාකාර මහතා විසින් රැස්වීමට සහභාගී වූ සියළුම රාජ්‍ය නිලධාරී මහත්ම මහත්මීන් සහ ගොවි සංවිධාන නියෝජිත මහත්ම මහත්මීන් පිළිගැනීම සහ රැස්වීමේ අරමුණ පැහැදිළි කිරීමෙන් අනතුරුව සභාවේ වැඩකටයුතු ආරම්භ කරන ලදී.

03.වැඩසටහන් පිළිබඳ සාකච්ඡාව

ආයතන සංවර්ධන කටයුතු-ජී .පීඑස්.පෙරේරා සංවර්ධන නිළධාරී

2018 වර්ෂයට අදළව ගොවි සංවිධාන 14 තුළම ගොවි සංවිධාන ගැටලු සාකච්ඡා කිරීමට, කාරක සභා ද, කන්නයට අදාළ තීරණ දැනුම් දීමට සහ ගැටලු සහගත අවස්ථාවල දී විශේෂ මහ සභාද නිල කාලය අවසන්වූ ගොවි සංවිධාන 06 ක නිළවරණ මහ සභා 06 ක්ද පැවැත්වීමට නියමිත බවත් 2018 වර්ෂයට අදාළ නිළවරණ මහ සභා 06 සඳහා සූදානම් විය යුතු බවත් සඳහන් කරන ලදි.

04.වාරිමාර්ග දෙපාර්තමේන්තුව

ඉදිරිපත් කිරීම-ජී.ආර්.අයි.එස්. ගම්ලත්-ඉන්ජිනේරු සහකාර

**හක්වටුනාඔය ව්‍යාපාරයේ කන්න රැස්වීම් තීරණ අනුව වම් ඉවුර වගා කළ බවත් ඒ සඳහා මේ වන විට ජල මුර 08 ක් නිකුත් කර ඇති බවත්,අද දින වන විට ජලාශයේ ජල මට්ටම අඩි 7.4 බවත්, එනම් අක්කර අඩි 2330 ක ජල ප්‍රමාණයක් ඉතිරිව පවතින බවත්,එහෙයින් අවසන් ජල මුරය නිකුත් කිරීමේ දී අගාවතට ජලය ගෙන යාම ගැටළුවක් විය හැකි බවත් , එම නිසා ගැටළුවක් නොවන අයුරින් කටයුතු කල යුතු බව වැඩි දුරටත් දන්වා සිටින ලදි.**

05.කෘෂිකර්ම දෙපාර්තමේන්තුව-එම්.පී.පී.එස්.කේ.සෝමරත්න මයා-කෘෂිකර්ම උපදේශක

**2018 යල කන්නයේ අතිරේක ආහාර බෝග වගාවට ගොවීන් යොමු කිරීමේ අරමුණින් සෝයා වගාව පිළිබඳ දැනුවත් කිරීමට තමන් අද දින තෝරාගත් බවත්, ඒ අනුව වර්ෂාපතනයේ යම් යම් වෙනස් වීම් නිසා ලබෙන වර්ෂාපතනය අඩු වීමත් සමඟ සෝයා වගාව එම දේශගුණ රටාවට ගැළපෙන සුදුසුම වගා ක්‍රමය බවත්,වැඩි දුරටත් දන්වා සිටින ලදි.නොයෙකුත් බාධාවන් මධ්‍යයේ වුවද ගිය කන්නනයේ සොයා වගාව සාර්ථක වූ බවත් දන්වා සිටින ලදි.**

06. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව-ජේ.එම්.බී.එන්.අබේසිංහ මයා- සහකාර අධ්‍යක්ෂ /සෝයා බෝග නායක

**අප රටේ සෝයා අවශ්‍යතාවයෙන් මෙට්‍රික් ටොන් 225000ක් ප්‍රමාණයක් පිටරටින් ගෙන්වන බවත්,ඒ සඳහා විශාල විදේශ විනිමයක් වැය වන බවත්, මෙම ව්‍යාපාරයේ පෙර කන්නයේද සෝයා වගාව සාර්ථක වූ හෙයින්,අත්දැකීම් අනුව සෝයා වගාවෙන් ඉහළ ආදායමක් ලබා ගැනීමට හැකි බව ගොවීන් දැනුවත් වී ඇති බැවින් 2018 යල ක්නයේද සෝයා වගාවට යොමු කිරීමේ අරමුණින් අද දින දැනුවත් කිරීමක් සඳහා මෙම ව්‍යාපාරය තෝරාගත් බවත්,මෙම කන්නයේ සෝයා බීජ 50% ක සහනාධාරයක් මත ලබා දීමට**

සුදානම් බවත්, ආමුකූලන නොමිලයේ ලබා දීමට කටයුතු කරන බවත්,බීජ අවශ්‍යතාවය සඳහා අක්කර 50 ක ප්‍රමාණයක් වගා කිරීමට බලාපොරොත්තු වන බවත් දක්ෂ ගොවි මහතුන්ට ඒ සඳහා යොමු විය හැකි බවත්,බීජ අවශ්‍යතාවය සඳහා වගා කරන සෝයා 1kgක් රුපියල් 220.00ක මුදලකට කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් මිලට ගන්නා බවත්, අනෙකුත් බීජ1kg ක් රුපියල් 95.00 ක මුදලකට මිලදී ගන්නා බවත්,සෝයා දන්වා සිටින ලදි.ඔනෑම බෝගයකට සුදුසු කාලයක් ඇති බවත්ඒ සඳහා ගැළපෙන කෘෂිකාර්මික ක්‍රම වේදයක් අනුගමනය කළ යුතු බවත්,දන්වන ලදි.

<u>07.ගොවි සංවිධාන ගැටලු හා යෝජනා ඉදිරිපත් කිරීම.</u>

| ඉදිරිපත්කළ අය | ගැටලුව/විමසීම/ යෝජනාව | විසඳුම හා අදහස් දැක්වීම |
|---|---|---|
| ව.ඉ.වදුරුස්ස ගොවි සංවිධානයේ ගරු සභාපති | අවසන් ජල මුරය ඉතා ඉක්මණින් ලබා දීමට කටයුතු කරන ලෙසත්,එමෙන්ම මෙම මුරය මඟින් 90% ක වගා බිම් ප්‍රමාණයකට ප්‍රමාණවත් බවත්,පසු වී වගා කටයුතු සිදු කළ 10%ක වගා බිම් ප්‍රමාණයකට තව ජල මුරයක් ලබා ගැනීමට හැකිවන අයුරින් දික් වැවේ ජල ප්‍රමාණයක් ඉතිරි කර දෙන මෙන් ඉල්ලීමක් ඉදිරිපත් කරන ලදි.<br><br>CRIP ව්‍යාපෘතියේ කෙත් ඇළවල් වල ප්‍රතිසංස්කරණ කටයුතු කොන්ත්‍රාත් කරුවන්ට නොදී ගොවි සංවිධානවලට ලබා දෙන ලෙස ඉල්ලා සිටින ලදි. | |
| ද.ඉ. ඇනිකට් ඇළ ගොවි සංවිධානය | තම ගොවි සංවිධාන බල ප්‍රදේශයේ ද ඇනිකට් එකට පහත් වන වතුරින් හක්වටුනාඔයෙන් 75%ක වගා බිම් ප්‍රමාණයක් සාර්ථක කර ගෙන ඇති බවත්,ඉතිරි 25%ක ප්‍රමාණය සාර්ථක කර ගැනීමට ඇනිකට් එක හරහා ජල මුරයක් ලබා දීමට කටයුතු කරන ලෙස ඉල්ලීමක් කරන ලදි මේ වන විට හක්වටුනාඔයේද ජලය නොමැති බව දන්වන ලදි. | |
| ද.ඉ.යාය 06 ගරු සභාපති | දකුණු ඉවුර සඳහා ජල මුරයක් නිකුත් කරනවානම් තමන්ටද ජලය අවශ්‍ය බවත් ඒ අනුව යාය 06 ගොවි සංවිධාන බල ප්‍රදේශයටම එනම් ගල්ටැංවැව දක්වා ජලය ලබා දීමට කටයුතු කරන ලෙස් ඉල්ලීමක් කරන ලදි. | |
| ව.ඉ. අගාර | තම ගොවි සංවිධානයේ CRIP ව්‍යාපෘතියේ | |

| | | |
|---|---|---|
| කටුගම්පළ ගොවි සංවිධානයේ ගරු ලේකම් | කොන්ත්‍රාත් අවසන් වුවත් තවමත් ගෙවීම් නොකළ බවත්, දන්වන ලදි. | |
| ද.ඉ.සියඹලාවැව ගොවි සංවිධානයේ ගරු ලේකම් | ගොයම් කිරි වදින තත්වයේ පවතින බැවින් තම ගොවි සංවිධාන බල ප්‍රදේශයටද පලය අවශ්‍ය බව පවසන ලදි. | |
| ව.ඉ ඩී4 ගොවි සංවිධානයේ ගරු සභාපති | වම් ඉවුරේ වගාව සඳහා ප්‍රමාණවත් ජල ප්‍රමාණයක් ලබා දීමෙන් අනතුරුව දකුණු ඉවුර සඳහා ජලය නිකුත් කිරීම සුදුසු බව දන්වන ලදි. | |
| ව.ඉ. සිසිල් පොකුණ ගොවි සංවිධානයේ ගරු සභාපති | ප්‍රධාන ජලාශයේ වම් ඉවුර සහ දකුණ ඉවුර සොරොව් දෙක ප්‍රතිසංස්කරණය කර දෙන මෙන් ඉල්ලා සිටින ලදි.<br>මීට ඉහත කමිටුවකදී ව්‍යාපාරයට අයත් බිම් ප්‍රමාණය කලාප ක්‍රමයකට බෙදූ බවත්,ඒ අනුව ඉදිරි කන්නය පිළිබඳව තීරණය එම කලාප ක්‍රමයට අනුව ගත යුතු බවත්,එය අද දිනම තීරණය කළයුතු බවත්, දන්වන ලදි.<br>පොහොර සහනාධාර මුදල් ලැබී නොමති දහතුන් දෙනෙකු තම ගොවි සංවිධානයේ සිටින බවත්,ඒ පිළිබඳව විමසා සිටින ලදි. | පොහොර සහනාධාරය ඉල්ලුම් කළ ගොවීන්ට මේ දක්වා පොහොර මුදල් ලැබී නොමති නම් එම මුදල් ලබා දීම සිදු වන බවත්,වපුරා දින 07ක් ඇතුළත රක්ෂණය සඳහා ඉල්ලුම් කළයුතු බවත්,යල් කන්නයට පොහොර සහනාධාර ඉල්ලුම් කිරීම පිළිබඳව තොරතුරක් ලැබී නැති බවත් දන්වන ලදි.- කෘ.ප.නි.ස මහතා |

එදිනම වම් ඉවුර සඳහා ලබා දීමට නියමිත අවසන් ජල මුරය නිකුත් කර ද.ඉවුර සඳහා එක් ජල මුරයක් ලබා දීම සුදුසු බවට තළාකොළවැව ගොවි සංවිධානයේ ගරු සභාපතිතුමා යෝජනා කළ අතර ඩී 04 ගොවි සංවිධානයේ ගරු සභාපතිතුමා විසින් එය ස්ථිර කරන ලදි. ඒ අනුව 2018/02/24 දින ජලය නිකුත් කිරීම සිදු කිරීමට ඒකමතිකව තීරණය විය.

<u>09. හක්වටුනාඔය ජලාශයේ පස් ඉවත් කර වැලි නිස්සාරණය කිරීමේ ව්‍යාපෘතිය</u> අදහස් ඉදිරිපත් කිරීම.

හක්වටුනාඔය ජලාශයේ පස් ඉවත් කර වැලි නිස්සාරණය කිරීමේ ව්‍යාපෘතිය සඳහා සවී ඉම්පෙක්ස් ,නැවික්, සියෙන්ගෝ ,යන ආයතන 06 ක් ඉල්ලුම් කරඇති බවත්,බවත්,සවී ඉම්පෙක්ස් ආයතනය මඟින් ඇළවල් කිහිපයක් තෝරා ගෙන ඇති බවත් ඒ අනුව බෝ ගහ ඇළ කෝන් ගහ ඇළ,උල්පත් ඇළ,ඉරුදෙණිය ඔය ඇතුළුව අක්කර 25සඳහා අනුමැතිය දී ඇති බවත් එහි ගැටළු සහගත තත්වයක් උද්ගත වීඇති බවත් අධීක්ෂණය සඳහා යොමු කළ පී.එම්.යූ පතිරාජ මහතා තනි තීරණයට අනුව ලබා දුන් ලිපිය අනුමත කළ නොහැකි බවත්,අනෙකුත් ගොවි සංවිධානවල අනු මැතිය ලබාගෙන නොමති බවත්,එය අනෙකුත් ගොවි සංවිධාන හා ඒකාබද්ධ ගොවි සංවිධානය පිළි නොගන්නා බව දැනුම් දෙන ලදි. එම ලිඛිත ප්‍රකාශය අවලංගු කර නැවත නිසි මැනීමක් කර එය කොන්ත්‍රාත්කරුවන්වෙත් භාර දීමට සුදුසු බව තලාකොළවැව ගොවි සංවිධානයේ ගරු සභාපති රෝහණ මහතා යෝජනා වඩුරැස්ස ගොවි සංවිධානයේ ගරු සභාපති කේ.වී අමරතුංග මහතා විසින් එය ස්ථිර කරන ලදි.

සියඹලාවැව ගරු සභාපති

වැලි බලපත්‍ර ලබා දීමේදී වාරිමාර්ග දෙපාර්තමේන්තුව ඇතුළු සියලු ආයතන වගකීමෙන් කටයුතු කළයුතු බවත්,ජලාශයට ජන ජීවිතයට හානියක් නොවන අයුරින් කටයුතු කරන ලෙසද ඉල්ලා සිටින ලදි.

සවී ඉන්පෙක්ස් ආයතනයේ නියෝජිතවරයා පවසා සිටියේ දැනට අක්කර 02 ක ප්‍රමාණයක රොන්මඩ ඉවත් කර අවසන් කර ඇති බවය.

නැවික් ඉන්පෙක්ස් ආයතනයේ නියෝජිතවරයා පවසා සිටියේ හක්වටුනාඔය ජලාශයේ පස් ඉවත් කර වැලි නිස්සාරණය කිරීමේ ව්‍යාපෘතිය සඳහා ව්‍යාපාර කමිටුවේ අවසරය ඉල්ලා සිටින ලදි.

කුලංකට්ටිය ගරු සභාපති තුමා පවසා සිටියේ වැලි සෝදා ඉතිරිවන පස් නැවත වැව තුළටම දමන බවත්,වැව හැරීමේ කටයුත්ත ඉන් සිදු නොවන බවත්ය.

ඒකාබද්ධ ගොවි සංවිධානයේ ගරු සභාපති ආර්.එම්.දිසානායක මහතා පවසා සිටියේ සියලු ගොවි සංවිධාන අද දිනම හක්වටුනාඔය ජලාශයේ පස් ඉවත් කර වැලි නිස්සාරණය කිරීමේ ව්‍යාපෘතිය පිළිබඳ අධීක්ෂණය කිරීම සඳහා ක්ෂේත්‍ර චාරිකාවක් කළයුතු බවත්,ඒ පිළිබඳ වාර්තාවක් සකස් කර ජලාශයට හානියක් නොවන අයුරින් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ [illegible]ායකයන්ට අනුකූලව කටයුතු කළයුතු බවත්,එම අධීකෂණ වාර්තාව සකස් කර අනුමැතිය ලබා දෙන තුරු දැනට සිදුකරන ව්‍යාපෘතීන් තාවකාලිකව නතර කළයුතු බවත්දන්වන ලදි.

10. ලිපි ඉදිරිපත් කිරීම.

01.තලාකොළවැව ගොවි සංවිධානයේ ඩබ් .ආර්.කිරිමැණිකේ යන අයගේ ඉඩම මැදින් කෙත් ඇළ මාර්ගයක් වැටී ඇති බවත්,මෙම කෙත් ඇළ ඩී03 බෙදුම් ඇළට සම්බන්ධව

පිහිටා ඇති බවත්,ඉඩම වටෙන්ද කෙත් ඇළ මාර්ගයක් වැටී අති බැවින්,ඉඩම දෙකඩ වී ඇති බැවින් එම ඇළ මාර්ගය ඉඩම වටෙන් ගමන් ගන්නා වූ දකුණු ඉවුර මහ ඇළට සම්බන්ධ කර සකස් කර දෙන මෙන් ඉල්ලීමක් ඉදිරිපත් කර තිබූ අතර , ගොවි සංවිධානයේ විරෝධතාවයක් නොවූ හෙයින් ව්‍යාපාර කමිටුවේ නිර්දේශය ලබා දෙන ලදි.වාරිමාර්ග ඉන්ජිනේරු සහකාර තුමිය ඒ පිළිබඳව අධීක්ෂණය කර අවශය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව දන්වන ලදි.

02. යාය 06 ගොවි සංවිධානයේ එච්.එම්.ඒකනායක මහතා විසින් යාය 06 ගොවි සංවිධාන බල ප්‍රදේශයට අයත් ගල්ටැන්වැව මහ වැවෙන් පස් කපා රොන්මඩ ඉවත් කර වැලි නිස්සාරණය කිරීම සඳහා අවසරය ඉල්ලා ව්‍යාපාර කමිටුවට ලිපියක් ඉදිරිපත් කරන ලදි. ගොවි සංවිධානයේ විරෝධතාවයක් නොමති බැවින් එයට අවශ්‍ය ඉදිරි වැඩකටයුතු කර ගෙන යාමට ව්‍යාපාර කමිටුවේ ද අවසරය ලබා දෙන ලදි.

<u>11. නේවාසික ව්‍යාපාර කළමනාකරු අදහස් දක්වීම හා ස්තුති කථාව</u>

අනතුරුව රැස්වීමට සහභාගී වූ සියළුම රාජ්‍ය නිලධාරීන්ට සහ ගොවි සංවිධාන නියෝජිත මහත්ම මහත්මීන්ට රැස්වීමට සහභාගීවීම වෙනුවෙන් නේවාසික ව්‍යාපාර කළමණාකාර මහතාගේ ස්තුතිය පිරිනැමීමෙන් අනතුරුව සභාවේ වැඩකටයුතු අවසන් කරන ලදී.

..............................................,
ඩබ්.එම්.ඩී. ගාමිණී කුසුම් ශ්‍රියානන්ද,
නේවාසික ව්‍යාපාර කළමණාකරු,
හක්වටුනාඔය ව්‍යාපාරය.

ඩබ්. එම්. ඩී. ගාමිණී කුසුම් ශ්‍රියානන්ද
නේවාසික ව්‍යාපාර කළමනාකරු
හක්වටුනාඔය ව්‍යාපාරය
එගොඩගම - මා එළිය

ගරුලේකම්,
ව්‍යාපාර කළමනාකරණ කමිටුව
පිටපත්:-.

1. අධ්‍යක්ෂතුමිය - වරිමාර්ග කළමණාකරන අංශය-කොළඹ (කා.දැ.පි)
2. නියෝජ්‍ය ගොවිජන සේවා කොමසාරිස්තුමිය-කුරුණෑගල(කා.දැ.පි)
3. නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ-කුරුණෑගල (කා.දැ.පි)
4. කලාප වාරිමාර්ග අධ්‍යක්ෂකුමිය - කුරුණෑගල (කා.දැ.පි)
5. ප්‍රාදේශීය ලේකම්- පොල්පිතිගම (කා.දැ.පි)
6. දිස්ත්‍රික් කළමණාකරු -පොහොර ලේකම් කාර්යාලය (කා.දැ.පි)
7. වාරිමාර්ග ඉන්ජිනේරුතුමා - ඉබ්බාගමුව (කා.දැ.පි)
8. ගොවිජන සේවා ප්‍රාදේශීය සංවර්ධන නිළධාරීතුමා-රඹේ (කා.දැ.පි)
9. ස[illegible]ර අ[illegible]ෂිරක්ෂණ මණ්ඩලය- කුරුණෑගල (කා.දැ.පි)
10. මුලස්ථාන කෘෂිකර්ම උපදේශකතුමා- රඹේ (කා.දැ.පි)
11. සියලුම අදාල වසම්වල කෘෂි පර්යේෂණ හා නිෂ්පාදන සහකාර මහත්ම මහත්මීන් (කා.දැ.පි)
12. සියලුම ගොවි සංවිධාන නිළධාරි මහත්ම මහත්මීන්-හක්වටුනාඔය ව්‍යාපාරය (කා.දැ.පි)

නේවාසික ව්‍යා.කළමනාකරු RPM } 072-4569418 ෆැක්ස් Fax } ඊ මෙල් E-mail }